**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(i) ඡේදය | 2018 වර්ෂයේ අධිකරණ අමාත්‍යාංශයෙන් අධිකාරියට ලබාදී තිබූ වාහන 08 ක ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කර නොතිබුණි. | අධිකරණ අමාත්‍යාංශය විසින් ලබාදුන් රථ වාහන පවරා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන සම්පූර්ණ කර 2020.09.28 දින අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතුකර වාහනවල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබූ අතර කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම පුහුණු අවස්ථා සහතික කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ . | චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,719,343ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.543,765ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,263,108ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ පුනරාවර්තන ප්‍රදානයන් ලැබීම අවම වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත, 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය මගින් හඳුන්වාදී | ජාතික අධිකාරියේ කටයුතු ආරම්භ කර පවත්වාගෙන යනු ලබන අතර මේ වන විට අත් පොත්, මාර්ගෝපදේශ හා මගපෙන්වීම් සකස් කරමින් පවතින බැවින් එම කාර්යයන් අවසන් වීමෙන් පසු ඒවායේ | චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක් සකස් කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | ඇති පුරවැසි /සේවාලහී ප්‍රඥප්තිය ප්‍රකාරව 2021 අප්‍රේල් 20 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කර පුරුවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සකස් කිරීමට අපේක්ෂා කෙරේ. | |
| (ආ) | දැනට අධිකාරියේ ක්‍රියාත්මක වන 1985 දරන ක්ෂනික දුරකථන සේවාව සඳහා Call Centre පහසුකම් ස්ථාපිත කිරීමට අවශ්‍ය මෘදුකාංග සහ දෘඩාංග ලබාගැනීමට මූල්‍ය අනුග්‍රහය UNDP ආයතනයෙන් ලබා ගැනීමට හැකියාව තිබූ අතර 2019 නොවැම්බර් සිට 2020 නොවැම්බර් දක්වා කළමනාකරණ මණ්ඩලයක් පත් කර නොතිබූ බැවින් අනුමැතිය ලබා ගැනීමට නොහැකිවීම නිසා එම මූල්‍ය ප්‍රදානය අධිකාරියට අහිමි වී තිබුණි. | 2019 නොවැම්බර් මාසයේදී Call Centre පහසුකම් ස්ථාපනය සඳහා මූල්‍ය අනුග්‍රහය UNDP ආයතනයෙන් සෘජුවම අදාල සකසන ආයතනයට ලබා ගැනීමට හැකිව තිබූ අතර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ මණ්ඩලයක් පත් කර නොතිබූ බැවින් (2019 නොවැම්බර් මස සිට 2020 නොවැම්බර් දක්වා) එම ප්‍රදානය අපිට අහිමි විය. | ඒ ඒ අවස්ථාවල ලැබෙන මූල්‍යමය ආධාර ලබා ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතුවේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ පනතේ 13 (1) (ඊ) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයන් හට පනතේ 29 වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | ආරක්ෂණ අරමුදලින් වන්දි ප්‍රදානය කිරීමට සහ අවශ්‍ය සහාය ලබා දීම සඳහා මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට 2019 අගෝස්තු 06 දින කළමණාකරණ මණ්ඩලය විසින් කමිටුවක් පත් කලද 2019.11.28 වන දින කළමනාකරණ මණ්ඩලය විසුරුවන ලද බැවින් එම කාර්යය අවසන් කිරීමට නොහැකි විය. 2020.12.15 වන දින අධිකාරියේ නව කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී මේ සඳහා නව කමිටුවක් පත් කල අතර අරමුදලින් වන්දි සහ මුදල් ගෙවීමේ ක්‍රමවේදය මේ වන විට සකස් කරමින් පවතී. | පනතේ (ඊ) වගන්තිය ප්‍රකාරව කඩිනමින් කටයුතු කළයුතු වේ. |
| (ආ) | පනතේ 13 (1) (ට) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සැපයීම සඳහා යෝජනා ක්‍රමයක් වැඩිදියුණු කිරීම, යොදා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබුණි. | සමකාලීන ශ්‍රව්‍ය දෘෂ්‍ය සම්බන්ධක මගින් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි දුරස්ථ ස්ථානවල සිට ලබා ගැනීම,වින්දිතයන් වෙනුවෙන් වින්දිත බලපෑම් ප්‍රකාශ සකස් කර අධිකරණයට ඉදිරිපත් කිරීම,රාජ්‍ය සහ සිවිල් සංවිධාන වල සහයෝගීත්වය ඇතිව වින්දිතයන් හට විවිධ සහාය ලබා දීමට කටයුතු කිරීම හා“අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදලින්” වන්දි ප්‍රදානය කිරීමේ සහ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් සකස් කිරීම යන සහාය සේවා මේවනවිට ක්‍රියාත්මක කරමින් පවතී. | පනත ප්‍රකාරව යෝජනා ක්‍රමයක් කඩිනමින් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අධිකාරියට ලැබී තිබුණු පැමිණිලි 556න් 266 ක් අවසන් කර තිබූ අතර අවසන් නොකල පැමිණිලි සංඛ්‍යාව 290 ක් වූයෙන් එය ලද සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 52 ක් විය. | 2020 වර්ෂය අවසාන වන විට අධිකාරියට ලැබුණු සියලු පැමිණිලි අතුරින් පැමිණිලි 266ක් 2020.12.31 වන විට සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත. | අධිකාරියේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | පනතේ 29 (4) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයන් සඳහා හා වින්දිතයෙකු මත යැපෙන්නන්ට ගෙවන වන්දි අරමුදලේ ප්‍රධාන වියදම් වන අතර පනතේ 2 (ඇ) වගන්තිය ප්‍රකාරව වින්දිතයන්ට එරෙහිව කල වරදක් නිසා වරදකරුගෙන් වින්දිතයන්ට වන්දි ලබාගැනීමට සැලැස්වීම අධිකාරියේ අරමුණක් වුවද සමාලෝචිත වර්ෂයේදී රැස්කල රු.6,681,270 ක දළ ආදායමෙන් පනතේ 29(4) වගන්තිය ප්‍රකාරව රු.17,943 ක් පමණක් පුද්ගලයින් 4 දෙනෙක් වෙත ගෙවා තිබුණි. ඒ අනුව වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ක්‍රමවේදය නිසි පරිදි ඉටුවේද යන්න ගැටළු සහගත විය. | අරමුදලින් වන්දි සහ මුදල් ගෙවීම සඳහා ක්‍රමවේදයක් සකස් කර අනුමත කරන තෙක් කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් පරිදි නිර්ණායක කීපයක් පදනම් කරගෙන වින්දිතයන් සිවු දෙනෙකු සඳහා 2020 වර්ෂය තුළදී රු.17,943 ක මුදලක් ගෙවා ඇත. | පනත ප්‍රකාරව වන්දි ගෙවීමේ යෝජනා ක්‍රමය කඩිනමින් සකස් කර වන්දි ගෙවීමේ කටයුතු ක්‍රියාත්මක කළ යුතුවේ. |

## 3.3 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ දෙවන අදියර යටතේ 2019 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබූ සහය හා රැකවරණ අංශ පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම සහ සහය හා රැකවරණය ලබා දීමේ වැඩසටහන් සඳහා ප්‍රමිතිගත ප්‍රොටෝකෝලයක් සකස් කිරීමට අධිකාරියට සහාය දීම සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඉටු කර නොතිබුණි. | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ දෙවැනි අදියර යටතේ 2019 වර්ෂයේ සහාය සහ රැකවරණ අංශයක් පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සකස් කිරීම මෙන්ම අනෙකුත් කාර්යයන් සඳහා UNDP ප්‍රදානය, ප්‍රමුඛත්වය දිය යුතු කාර්යයන් වලට යෙදවීමට සිදු වූ නිසා ප්‍රමාණවත් නොවීය. | ප්‍රමුඛතාවය මත කාර්යයන් සැලැසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත සේවක සංඛ්‍යාව 56 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 36 ක් වූ අතර ආයතනයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සෘජුවම බලපාන පුරප්පාඩු තනතුරු 15 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | අධ්‍යක්ෂ,නීති නිලධාරී, විමර්ශන නිලධාරී, සන්නිවේදන නිලධාරී සහ කළමනාකරණ සහකාර තනතුරුවල පුරප්පාඩු සඳහා ඉදිරි මාස කිහිපය තුළ බඳවා ගැනීම් සිදු කිරීමට අපේක්ෂිතය. රැකවරණ නිලධාරීන් සුපරීක්ෂණය ඉහත පුරප්පාඩු පවතින තනතුර යටතේ වන බැවින් එම බඳවා ගැනීම් සිදු කළපසු ඔවුන් බඳවා ගන්නා අතර කාර්යාල කාර්ය සහායක පුරප්පාඩු බහුකාර්ය සංවර්ධන කාර්සාධක බලකා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත . | අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ස්වංක්‍රීය සිද්ධි කළමනාකරණ පද්ධතියක් අධිකාරිය තුළ නිර්මාණය සහ ස්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණද 2021 අප්‍රේල් 27 දින වන විටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම අධිකාරියේ අරමුණු ළඟා කර ගැනීමේදී අත්‍යාවශ්‍ය වන සහය හා රැකවරණ අංශය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් කාර්යය 2019 සහ 2020 වර්ෂවල ක්‍රියාකාරී සැලැසුම්වලට ඇතුළත් කර තිබුණද එම බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ස්වයංක්‍රීය සිද්ධි කළමනාකරණ පද්ධතිය අධිකාරිය තුළ ස්ථාපනය කිරීමට සැලසුම් කළද එම වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යටතේ දෙන ලද ප්‍රදානය, ප්‍රමුඛත්වය දිය යුතු දැනුවත් කිරීමේ වැඩසටහන් වලට යෙදවීමට සිදු වූ නිසා එය කළ නොහැකි විය.<br>අධිකාරියේ රැකවරණ අංශය මේ වන විට සහකාර අධ්‍යක්ෂ (නීති) යටතේ පිහිටුවා අංශයට අදාළ කාර්යභාරය ඉටු කරනු ලබයි. එම අංශයේ අධ්‍යක්ෂ (රැකවරණ) සහ කාර්ය මණ්ඩල බඳවා ගැනීමට අවශ්‍ය සියළු පියවර මේවන විට ගෙන ඇති අතර කොවිඩ් වසංගතය හමුවේ බඳවා ගැනීම් කටයුතු අවසන් කිරීම ප්‍රමාද වී ඇත. | කාර්යයන්ගේ ප්‍රමුඛතාවය සහ මූල්‍ය සම්පාදනය යන කරුණු මත පදනම්ව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළයුතු වේ. සහාය හා රැකවරණ අංශයේ කාර්ය මණ්ඩලය කඩිනමින් බඳවා ගෙන අධිකාරියේ අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළයුතු වේ. |